DOI: 10.31357/fhssmst.2011.00052

# ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය

# (1870 – 1911)

01 JAN 2013

මාතොට ආරච්චිගේ නිෂාදි රත්නාවලී

ශාස්ත්‍රපති 2011

# ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය

# (1870 – 1911)

මාතොට ආරච්චිගේ නිෂාදි රත්නාවලී

**GS/ MA/ SIN/ 3029/ 07**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

සඳහා ඉදිරිපත් කෙරෙන

නිබන්ධය

2011

## උපාධි අපේක්ෂිකාවගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි.

01/01/2013
.................................
දිනය

.................................
අපේක්ෂිකාවගේ අත්සන

# සුපරීක්ෂකගේ ප්‍රකාශය

මෙම අපේක්ෂිකාව විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම සුදුසු බවත් නිර්දේශ කරමි.

01-01-2013
..................................

දිනය

..........................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය)

# පටුන

පිටු අංකය


පටුන v - vii

ස්තුතිය viii

සාරාංශය ix

**පළමු වන පරිච්ඡේදය – හැඳින්වීම** 1 - 4

1.1. අධ්‍යයනයේ පසුබිම හා අරමුණු 4 - 8

1.2. මූලාශ්‍රය හා ක්‍රමවේදය 8 - 9

1.3. සාහිත්‍යයික සමීක්ෂාව 9 - 22

1.4. අධ්‍යයනයේ සීමාව හා මුහුණදුන් ගැටලු 23

1.5. පර්යේෂණ නිබන්ධයේ ආකෘතිය 24 - 25

**2 වන පරිච්ඡේදය**

**ප්‍රාසංගික කලාව**

2.1. ප්‍රවේශය 26 - 28

2.2. කලාව 29 - 32

2.3. ප්‍රාසංගික කලාව පිළිබඳ විවිධ මත 32 - 37

2.4. ප්‍රාසංගික කලාවේ ලක්ෂණ, ප්‍රභේද හා

ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාව 37 - 41

2.5. නාට්‍ය කලාව තුළ ප්‍රාසංගික ලක්ෂණ 41 - 46

3 වන පරිච්ඡේදය

3.1. නාඩගම (1870 – 1911 කාලයට අදාළ නාඩගම්) 47 - 48

3.2. නාඩගම: ප්‍රාසංගික ලක්ෂණ 49 - 55

3.3. නාඩගම්හි සිංදු 56 - 57

3.4. නාඩගම් ශෛලිය හා සංගීතය 57 - 62

3.5. නාඩගම් සංගීතයේ විශේෂ ප්‍රාසංගික ලක්ෂණ 62 - 78

3.6. නාඩගම පිරිහීම 79 - 82

3.7. නාඩගම: සමාලෝචනය 83

4 වන පරිච්ඡේදය

4.1. 1870 – 1911 කාලයට අදාළ නූර්ති 84 - 86

4.2. නූර්ති පසුබිම 87 - 88

4.3. නූර්ති සම්ප්‍රදාය 89 - 91

4.4. රංග ශාලා 91 - 92

4.5. චිත්‍රපට, රංග භාණ්ඩ හා වේදිකා ප්‍රයෝග 93 - 96

4.6. නූර්ති නාට්‍ය කලාවේ ඇඳුම් පැළඳුම් 96

4.7. නූර්ති වේදිකාව හා තිරරෙදි 97 - 98

4.8. නූර්ති නාට්‍යයේ රංග භාණ්ඩ හා සජීවී දර්ශන භාවිතය 99 - 100

4.9. නූර්ති කෙරෙහි වූ බටහිර හා පෙරදිග ආභාසය 100 - 101

4.10. නූර්තියේ ප්‍රාසංගිකත්වය හා විවිධත්වය 101 - 105

4.11. නූර්තියේ ගීත හා සංගීතය 105

4.12. නූර්ති: ප්‍රාසංගික ලක්‍ෂණ 106 - 111

4.13. ජෝන් ද සිල්වා හා නූර්ති කලාව 112 - 116

4.14. නූර්තිය : සමාලෝචනය 117

සමාලෝචනය 118 - 124

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 125 – 131

උපග්‍රන්ථය : විස්තර නාමාවලිය 132 - 133

උපග්‍රන්ථය I (වර්තමානයේ සොයාගැනීම දුෂ්කර මුද්‍රිත නූර්ති පිටපත්) 134 - 252

උපග්‍රන්ථය II (අමුද්‍රිත නාඩගම් අත් පිටපත් දෙකක්) 253 - 260

උපග්‍රන්ථය III (මාතෘකාවේ විෂය ක්ෂේත්‍රයට අදල දුර්ලභ ඡායාරූප කිහිපයක්) 261 - 272

## ස්තුතිය


- ස්වකීය වටිනා කාලය මාගේ පර්යේෂණ අවශ්‍යතා සහ උපදෙස් දීම සඳහා පමණක් නො ව දුලබ පොත පත පවා ලබාදෙමින් හා පියෙක් මෙන් පෙනී සිටිමින් මෙම පර්යේෂණ කාර්යය සාර්ථකව කරගෙන යාමට අපමණ ඇප උපකාර කළ මාගේ සුපරීක්ෂක ලෙස කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ගුරු පියාණන්ට;
- පර්යේෂණ ක්‍රම විද්‍යාව කියාදෙමින් හා මෙම අධ්‍යයනය කරගෙන යාමට මතු නො ව විවිධ පොත පත සපයා දෙමින් ද නන් අයුරින් මා දිරිමත් කළ මාගේ ගුරුවරයෙකු වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විශ්‍රාම ගිය සේවාර්ජිත මහාචාර්ය සාහිත්‍යසූරී තිස්ස කාරියවසම් ගුරු පියාට;
- පර්යේෂණය ආරම්භ කළ මුල් කාලයේ මාස කිහිපයක් අධ්‍යයන නිවාඩු ලබාදෙමින් අප දිරිමත් කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාත්, විවිධ අයුරින් උපකාර කළ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පීඨාධිපතිතුමාත්, නාට්‍ය මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමා සහ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ මාගේ අධ්‍යයනාංශයේ සහෝදර ආචාර්යභවතුන්;
- තොරතුරු එක්රැස් කිරීමේ දී කැමැත්තෙන්ම විවිධ දත්ත සපයා දුන් සම්පත් දායක සුධීන්ට;
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල, කොළඹ ජාතික කෞතුකාගාරය, රාජ්‍ය ලේඛනාගාරය යන තන්හි පුස්තකාලයාධිපතිවරුන්ට හා කාර්යය මණ්ඩලයට;
- මෙම නිබන්ධයේ සෑම පිටුවක්ම එක්වරක් නොව කිහිපවතාවක්ම පරිගණක ගත කර මුද්‍රිත පිටපත් ලබාදෙමින් හා එය තමාගේම කටයුත්තක් සේ සලකා අවසාන නිබන්ධ පිටපත ද මැනවින් පරිගණක අක්ෂර සංයෝජනය කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රයේ නලින්ද ඉන්ද්‍රජිත් හිතවතාට;

සහ

- මෙම පර්යේෂණ කාර්යය සාර්ථක කරගෙන යාමට නන් අයුරින් උදව් උපකාර කළ සියලුම දෙනාටත් මාගේ ගෞරවනීය
- ස්තුතිය හිමිවන්නේය.

# “ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය” (1870 – 1911)

මාතොට ආරච්චිගේ නිෂාදි රත්නාවලී

## නිබන්ධ සාරාංශය

මෙම අධ්‍යයනය ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය (1870 – 1911) සම්බන්ධවයි. එහිදී ප්‍රාසංගික කලාව යනු කුමක් ද යන්න විග්‍රහ කෙරේ. කලාව යනු කවර විෂය ක්ෂේත්‍රයක් ද යන පසුබිම මෙහි දී සාකච්ඡා කළ අතර නූතනයේ එහි කාලෝචිත බව හා වැදගත්කම පිළිබඳ අවධානය යොමු කෙරිණි. යථොක්ත කාල පරාසය සීමා කොට ගත්තේ එතෙක් පැවැති නාඩගම් කලාව හා සම්බන්ධයෙන් වූ ප්‍රථම නාඩගම මුද්‍රණයෙන් ප්‍රකාශය වූ වර්ෂය 1870 වූ බැවිනි. ඒ පිලිප්පු සිඤ්ඤෝ රචනා කළ ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම යි. එමෙන්ම එම දසකය තුළම නාට්‍යධර්මී කලා රීතිය ශ්‍රී ලාංකේය ජනතාව අත්විඳි කාලය ද විය. නාඩගමේ පිරිහීම ආරම්භ වන කාලය හා නූර්ති නැමැති නව කලාංගයේ ආරම්භය වූ ආසන්නතම කාලය නිසාත් නාට්‍යධර්මී කලා රීතිය ලාංකික සමාජය අත්දකින්නේ මෙම දසකයේ මෙරටට ඉන්දියාවේ සිට පැමිණි හින්දුස්ථානි ඩ්‍රැමටික් කොම්පැණිය නියෝජනය කළ මෙහෙර්වන්ජී බලිවාලා ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායමෙන් වීමත් 1870 වසර විශේෂ වශයෙන් පර්යේෂණයේ කාලසීමාව ලෙස යොදා ගතිමු. මේ අධ්‍යයන කාල සීමාව 1911 වර්ෂයෙන් අවසන් කෙරේ.ඊට හේතු වන්නේ එතෙක් පැවැති නාඩගම් හා නූර්ති රඟදැක්වීම් නව නෘත්‍ය ශාලාවක් තුළ මහජනතාවට ප්‍රදර්ශනය ආරම්භවීමේ අවස්ථාව නිසාය. එය ටවර්හෝල් රඟහලයි. එය විවෘත වූයේ 1911 දීය. මේ කරුණු අනුව නාඩගම් හා නූර්ති ආශ්‍රය කොටගෙන ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය තත් කාල වකවානුවේ පැවැති ආකාරය මෙම අධ්‍යයනයට පාදක වී තිබේ.

ඉහත කාල වකවානුව තුළ ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාව වර්ධනය වූ ආකාර මෙහිලා විග්‍රහ කළේ; තත් කාලය තුළ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් නාඩගම් හා නූර්ති පිටපත් ආශ්‍රයෙන් ය. එහි දී මුද්‍රිත පෙළ, පෙළ ප්‍රයුංජනය, රංගය, සංගීතය, ඇඳුම් පැළඳුම්, වේදිකා ආලෝකය, වේෂ භූෂණ, වේදිකා සැරසිලි, භූමි දර්ශන හා විශේෂ පසුතල නිර්මාණ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ප්‍රාසංගික කලාව ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය මෙම නිබන්ධයේ දක්වා තිබේ.

## 01 වන පරිච්ඡේදය

### හැඳින්වීම :-

නූතන බටහිර අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පිළිගැනුණු ශික්ෂණයක් වන ප්‍රාසංගික කලා අධ්‍යයන රීති අනුව ශ්‍රී ලංකාවේ නාඩගම් හා නූර්ති ආශ්‍රය කරගෙන 1870 සිට 1911 දක්වා වූ වසර තිස් හතරක කාලපරාසය තුළ ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය සිදුවූ ආකාරය අධ්‍යයනය කිරීම මින් අදහස් කෙරේ. මෙහි දී අපගේ පර්යේෂණ කාල පරාසය ආරම්භ වන 1870 වසර කඩඉම් වසරක් ලෙස යොද ගනු ලැබීමට හේතු වූ කරුණු දැක්වීම අවශ්‍ය බව කිව යුතුය.

ක්‍රි:ව: 1870 වර්ෂයට පෙර බොහෝ කලක සිටම ලංකාවේ ඒ ඒ ප්‍රදේශවල උඩරට පහතරට සහ සබරගමුව නමින් හඳුන්වන සාම්ප්‍රදයික නර්තන පද්ධතීන් ත්‍රිත්වයක් තිබුණ අතර ඒවායේ ද නූතනයේ සාකච්ඡා කෙරෙන නවතම විෂය ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වන "ප්‍රාසංගික" ලක්ෂණ යම් පමණට හෝ තිබුණු බව පිළිගැනීමට සිදුවේ. එය එසේ නොවුණා නම් තුන්තිස් පැයක් තිස්සේ ජනතාව ඒ හා සමඟ බද්ධ වී ඒවා නරඹනු දැකිය නොහැකි වනු ඇත. එහෙත් පූර්වෝක්ත ශාන්තිකර්ම, ඒවායේ නාට්‍යමය ලක්ෂණ සහිත පෙළපාළි මතු නොව, සොකරි, කෝලම් වැනි ජනනාටක ද ඒ ඒ ප්‍රදේශවල ජනතාව භේදයකින් තොරව නරඹා රස වින්දහ. අදද තත්ත්වය එසේමය.

මීට අමතරව 1824 දී පමණ ආරම්භ වූසේ පිළිගැනෙන නාඩගම් නමින් හැඳින්වූ නාට්‍ය විශේෂය ද දිවයිනේ විවිධ ප්‍රදේශවල ජනප්‍රිය වී තිබිණ. දේශීය ජන නාටක හා ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාළිවලට වඩා වෙනස් වූ මෙම කලාංගය දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ ප්‍රභාව ලබමින් කිසියම් ආකාරයක සංගීතාත්මක ගීත නාටක ස්වරූපයෙන් වේදිකාවක් මත රඟදැක්වූ මනස්කාන්ත රංග විශේෂයක් විය. එහි නළු නිළියෝ ජන නාටකවල මෙන් නොව චරිතයට ගැළපෙන මනස්කාන්ත අලංකාර ඇඳුම් පැළඳුම්වලින් සැරසී අදළ රංග භාණ්ඩ රැගෙන සංගීතයට (සර්පිනාව, මද්දලය) අනුව

වේදිකාවේ රැඟුම් පැහ. එකී නාට්‍ය සම්ප්‍රදායයෙන් ද නූතනයේ භාවිත "ප්‍රාසංගික" යන පදයෙන් ප්‍රතීයමාන අර්ථයට සාපේක්ෂ ප්‍රාසංගික ලක්ෂණ විද්‍යමාන විය. එහෙත් නාඩගමෙහි ගායනය හා සින්දු රාග තාල ඒකාකාරී වූ බැවිනුත්, දින කිහිපයක් එකම නාඩගම රඟදැක්වීමත්, නාඩගම් රඟදක්වන ස්ථානය තුළ රාත්‍රී කාලයේ සිදු වූ නොයෙකුත් දූෂණ, අපචාර වැනි කටයුතු ආදී බොහෝ කරුණු හේතුවෙන් නාඩගම ජනතාව අතරින් යම් තරමකට හෝ දූරස්ථ වෙමින් පැවතිණි. ජනතා ප්‍රසාදය හා කැමැත්ත මෙසේ ඒ මේ අත දෝලනය වෙමින් පැවති අවධියක එක් වරට ප්‍රාතිහාර්යයක් මෙන් තත් කලා ක්ෂේත්‍රයේ විශාල වෙනසක් සිදු විය.

එතෙක් ලංකාවේ ජනතාව දුටුවේ ලාංකේය නර්තන සංස්කෘතින්ට අනුගතවූ නර්තන, ගායන, වාදන, ජන නාට්‍ය, නාට්‍ය හා බැඳි ජන රඟමඩල ඒකාලෝක කළ රංග ප්‍රයුංජනයකි. 1870 දී පිලිප්පු සිංඤෝ නැමැත්තා විසින් රචනා කරන ලද ප්‍රථම නාඩගම ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්විය. එහෙත් 1877 දී භාරතයේ හින්දුස්ථානී ඩ්‍රැමටික්ස් කොම්පැණිය නමින් හැඳින්වූ බලිවාලා නම් නාට්‍යකරු ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායමක් ලංකාවට පැමිණියහ. මෙම නාට්‍ය කණ්ඩායම ලංකාවේ විශේෂයෙන්ම කොළඹ නගරයේ ඔවුන්ගේ ප්‍රකට නාට්‍ය ද්වයක් වූ ඉන්දර්සභා සහ කෛසර් ජපීර් යන නාට්‍ය යුගලය ප්‍රදර්ශනය කළහ. මෙයින් ඉන්දර්සභා නාටකය ප්‍රේම වෘත්තාන්තයක් වන අතර කෛසර් ජපීර් නාටකය ප්‍රහසනයක් විය. මෙම නාට්‍ය නැරඹීමට කොළඹට පැමිණියේ දිවයිනේ දස දෙසින් විවිධ රැකියා සඳහාත් වෙනත් අවශ්‍යතා සඳහාත් පැමිණි පිරිසය. ඔවුහු මෙම නාට්‍ය නැරඹීමෙන් මහත් ආස්වාදයක් ලැබූහ. එබැවින් මෙම විදේශීය නාට්‍ය නැරඹීමට දිනෙන් දිනම ජනතාව මහත් උනන්දුවක් දැක්වූහ. ඒ සමඟ ම එතෙක් ජනතාව අතර ජනප්‍රියව තිබූ නාඩගම නම් වූ නාට්‍ය විශේෂය ජනතාව අතරින් ක්‍රමයෙන් දුරස්වන්නට විය. එහෙත් මෙයින් අධෛර්යමත් නොවූ ලංකාවේ එවකට සිටි නාට්‍යකරුවෝ ද පූර්වෝක්ත ඉන්දියානු නාට්‍ය අනුව යමින් අමුතුම මාදිලියේ නාට්‍ය විශේෂයක් නිර්මාණය කළහ. ඔවුහු එතෙක් ලංකාවේ පැවති නාඩගම්වලින් එම නව නාට්‍ය සම්ප්‍රදාය වෙසෙසා හැඳින්වීම පිණිස එය "නූර්ති" නමින් හැඳින්වූහ. 1877 බලිවාලාගේ

ඉහත දැක්වූ ඉන්දර්සභා සහ කෛසර් ජපීර් නාට්‍ය ද්වයය නිසා එතෙක් ලංකාවේ පැවති නාට්‍ය රීතිය උඩු යටිකුරු කරමින් ප්‍රාසංගික ලක්ෂණ සහිත නව නාට්‍ය සම්ප්‍රදායක් වූ නූර්ති ලංකාවේ ව්‍යාප්ත වන්නට විය. එබැවින් අපගේ මාතෘකාවට අදළව 1870 වර්ෂය පර්යේෂණ කාල පරාසයේ ආරම්භක වර්ෂය ලෙස යොදා ගත්තෙමු.

ඉහත දැක්වූ ආකාරයට 1870 දී ප්‍රථම නාඩගම මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්වීමෙන් පසු 1877 දී ආරම්භ වූ "නූර්ති" නම් වූ නාට්‍ය විශේෂය කොළඹ නගරය හා තදාසන්න නගරවල තාවකාලිකව තැනූ රඟමඬල තුළත්, ස්ථිර රඟහල තුළත් ප්‍රදර්ශනය කළ අතර එතෙක් බොහෝ දෙනා ඉල්ලා සිටි ස්ථිර "ජාතික රඟහලක" අවශ්‍යතාව සපුරාලමින් 1911 දී මරදාන ටවර් රඟහල ආරම්භ කරන ලදී. (එහෙත් ටවර් රඟහල ජාතික රඟහලක් ලෙස දිගටම භාවිත කළ බවට සාධක නොලැබේ.) එයින් පසු සියලුම නූර්තිකරුවන් පාහේ තම නූර්ති ටවර් රඟහලේ දී ඉදිරිපත් කිරීමට උත්සාහයක් ගත් අතර ඒවා "ටවර් හෝල් නාට්‍ය" යන ව්‍යවහාර නමින් ද ප්‍රසිද්ධ විය. 1911 දී සිදු වූ මේ වෙනස්වීම හේතු කොට ගෙන අප අපගේ පර්යේෂණ කාල පරාසයේ අවසාන වසර 1911 ලෙස යොදා ගත්තෙමු.

ඒ අනුව මෙම පර්යේෂණයට අදළව අධ්‍යයනය කරනු ලබන්නේ 1870 – 1911 කාලයට අදළ වසර 41 ක කාලය තුළ ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාවේ වර්ධනය සිදු වූ ආකාරයයි.

මෙම කාල පරාසය තුළ බිහිවූ බව පිළිගැනෙන නාඩගම හා නූර්ති යන කලාංගයන්ගේ සංඛ්‍යාව පිළිබඳ විවිධ මතභේද තිබේ. කෙසේ වෙතත් මෙම නාට්‍ය වර්ග ද්වයයම රඟදැක්වූ ආකාරය හා රංගයේ ප්‍රාසංගික බව පිළිබඳ තොරතුරු ලබාගත හැකි සාධක නැතිතරම්ය. එබැවින් අපගේ පර්යේෂණය මුළුමනින්ම තත් කාල පරාසයට අදළව මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්ව ඇති නාඩගම් පිටපත් හා නූර්ති පිටපත් ආශ්‍රයෙන් කරනු ලබන පර්යේෂණයක් බව සඳහන් කරණු කැමැත්තෙමු. අදල වසර 41 ක කාලය තුළ ප්‍රාසංගික කලාව වර්ධනය වූ ආකාරය පූර්වෝක්ත පිටපත්

කියැවීමෙන්, ඒවා එකිනෙක සංසන්දනය කිරීමෙන් හා මනෝමූලික ලෙස රංග ප්‍රයුංජනය කිරීමෙන් පැමිණෙන නිගමනයන් අනුව ඉදිරිපත් කිරීමට අදහස් කෙරේ.

## 1.1.අධ්‍යයනයේ පසුබිම හා අරමුණු

රෝගෝපශමනය හා සශ්‍රිකත්වය පරමාර්ථයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලාංකේය සමාජය තුළ පවත්නා උඩරට, පහතරට හා සබරගමුව යන නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම සහ ඊට ම බද්ධ වී ඇති නාට්‍යමය පෙළපාළි වලත් තිබුණ බව පිළිගැනෙන ජීවමාන භාවය හා ඉදිරිපත් කිරීමේ ගුණය හේතුවෙන් තුන්තිස් පැයක් පුරා ඒවා නැරඹීමට එකල ජනතාව මහත් රුචියක් දැක්වූ බව පෙනේ. එසේ නම් එකී ඉදිරිපත් කිරීම් කාලීන ජන විඥානය අවබෝධ කරගත් පාරම්පරික ශිල්පීන්ගේ කලාත්මක ඉදිරිපත් කිරීම්, නැතහොත් තත්කාලීන ශිල්පීන්ගේ ප්‍රාසංගික ඉදිරිපත් කිරීම් යැයි සැලකීම යුක්ති යුක්තය.

වසර 19 කට වැඩි කාලයක් ලංකාවේ උඩරට රජුගේ සිරකරුවෙකු වශයෙන් සිට මෙම රටින් පැනගිය රොබට් නොක්ස් නම් ඉංග්‍රීසි ජාතිකයා විසින් රචනා කොට ක්‍රි.ව. 1681 අගෝස්තු මාසයේ දී ප්‍රථමවරට එංගලන්තයේ දී මුද්‍රණය කරන ලද An Historical Relation of the Island Ceylon in the East – Indies කෘතියේ දී නොක්ස් විසින් උඩරට ප්‍රදේශයේ ගැමි ජනතාවගේ ඇදහිලි, දේව විශ්වාස හා අත්භූත බලවේග පිළිබඳ දක්වා ඇති තොරතුරුවලින් ද හෙළිවන්නේ බොහෝ කාලයක් තිස්සේ ශ්‍රී ලාංකේය සමාජය තුළ කිසියම් ආකාරයක ප්‍රාසංගික ලක්ෂණ සහිත සංස්කෘතිකාංග තිබූ බවයි.

ඉංග්‍රීසි ජාතික හියු නෙවිල් විසින් ක්‍රි.ව. 1869 – 1886 කාලය තුළ එක්රැස් කරන ලද පුස්කොළ අත්පිටපත් අතර, ශාන්තිකර්ම හා සම්බන්ධ කවි ඇතුළත් පුස්කොළ අත්පිටපත් රාශියක් තිබේ. මෙයින් ගම්‍ය වන්නේ අදාල කාලය වන විට ශාන්තිකර්ම කිසියම් ආකාරයකට සමාජය තුළ ජනප්‍රියව පැවැති කලා අංගයක් බවයි.

ලංකාවේ වැද්දන් ගැන සාර්ථක මානවවිද්‍යාත්මක පර්යේෂණයක් කළ සී.ජී.සෙලිග්මාන් හා බර්නාඩ් සෙලිග්මාන් දෙපල 1911 දී The Vaddas නමින් ග්‍රන්ථයක් මුද්‍රණය කළ අතර (එම කෘතියේ සිංහල පරිවර්තනය, වැද්දෝ, පරිවර්තනය – චන්ද්‍රශ්‍රී, රණසිංහ, ෆාස්ට් පබ්ලිකේෂන් - 2009) එහි ix සහ x පරිච්ඡේදවල 1907 – 1911 අතර කාලයේ දී වැද්දන්ගේ විවිධ ශාන්තිකර්ම පිළිබඳ විස්තර සහ ඡායා රූපද දක්වා තිබේ. එම විස්තරවලින් එකල වැදි ජනතාව අතර ප්‍රාසාංගිකත්වය පිළිබඳ දැනුමක් නොතිබුණ ද පාරම්පරිකව පවත්වාගෙන ආ ශාන්තිකර්ම ගැනු තිබූ දැනුම හා ඉදිරිපත් කිරීමේ දී ඔවුන් අනුගමනය කළ ක්‍රමවිධි හඳුනාගත හැකිය. සෙලිග්මාන්ගේ විස්තරයෙන් පෙනෙන්නේ ඔවුන්ට කිසියම් කලා කටයුත්තක්, චරිතයක් ඉදිරිපත් කිරීමේ දී කිසියම් ලෙසක සමාරෝපයක් මවාගෙන "රඟපෑ" බවයි. (වැද්දෝ 293 – 264) බලන්න. නොඑසේ නම් ඔවුන්ට ප්‍රේක්ෂකයා පිළිබඳ කිසියම් අවබෝධයක් තිබූ බවයි.

H.Parker විසින් 1910 දී (ප්‍රථම මුද්‍රණය) ප්‍රකාශයට පත් කරන ලද Village Folk tales of Ceylon – Vol – 01 – Tisara Prakashakayo – Second Re Print – 1982) කෘතියේ අන්තර්ගත ජනකතා දෙස බැලීමේ දී පෙනෙන්නේ දිවයින පුරා ජනකතා කලාව ජනප්‍රිය කලා අංගයක් ලෙස පැතිරී තිබූ බවයි. එහි පිටු අංක 358, 363, 134, 136, පිටුවල ඇති ජනකතා ඊට උදාහරණ සපයයි.

තත් කාලයේ ග්‍රාමීය සමාජ සංස්ථාව තුළ ගැමි පරිසරයක වට රවුම් රඟමඩල තුළ රාත්‍රියේ රඟදැක්වූ සොකරි කෝලම් වැනි ජන නාටක ද කිසියම් ප්‍රමාණයක ප්‍රාසංගික ලක්ෂණ ප්‍රකට කළ ජනකලාංග ලෙස හැඳින්විය හැකිය. සොකරි හා කෝලම්වලට ද භාවිත ඇඳුම් පැළඳුම් රංගනය, වෙස්ගැන්වීම, පසුතල සැරසිලි, රංගභාණ්ඩ ආදිය ගැන ද සලකන කල්හි ඒවායේ ද කිසියම් ආකාරයක ප්‍රාසංගික ලක්ෂණ විද්‍යාමාන වූ බව නිරනුමානය.

මීට අමතරව අපගේ පර්යේෂණ මාතෘකාවට අදාළ කාල පරාසය තුළ "නාඩගම" නමින් ප්‍රකට නාට්‍ය විශේෂයන් ද තන්හි තන්හි එළිමහන් වේදිකාවල රඟදැක්වූහ. මේ වූ කලී දක්ෂිණ භාරතීය තෙරුක්කූත්තු, යක්ෂගාන හා භගවතමේල ආභාසයෙන් දමිළ සංස්කෘතිය තුළින් සිංහල සමාජයට ලැබුණු කලාංගයක් බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. මෙම කලාංගයේ දී ප්‍රථමවරට ආරම්භ වූ සිංහල රජ පෙළපතේ ඇතැම් සංසිද්ධීන් අන්තර්ගත සිංහලේ නාඩගම මෙන්ම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ යම් යම් සංසිද්ධීන් විස්තර කෙරුණ නාටක වූ අතර සමහරක් බටහිර සාහිත්‍ය ඉතිහාසයේ වැදගත්කමක් ගත් බැලසන්ත, බ්‍රම්පෝඩි වැනි කථා ප්‍රවෘත්ති අනුසාරයෙන් රචනා වූ නාඩගම් ය.

සිංහල ශාන්තිකර්ම හෝ ඒවායේ නාට්‍යමය පෙළපාලි මෙන් නොව නාඩගම වූ කලී උස් හඬින් සංගීත ස්වර මත පිහිටා මිහිරිව ගායනා කරනු ලැබූ සිංදු වලින් උපලක්ෂිත වූවකි. නාඩගම ගද්‍යමය සංවාද පවා පද්‍ය ආකෘතියකින් ගයමින් ගීත නව ආකාරයෙන් රඟදැක්වූ නාට්‍ය විශේෂයකි. එහි වෙස් ගැන්වීම, තුළින් සාත්වික අභිනය මනාව දිස්විය. ඒ ඒ චරිතයට ගැළපෙන ඇඳුම් පැළඳුම්වලින් නළුවන් සැරසී සිටි බැවින් ආහාර්ය අභිනය මනාසේ ප්‍රකට විය. ගීත; ස්වර අනුකූලව සංගීතාත්මකව ගායනා කිරීම තුළින් වාචිකාභිනය ද ගීතයකට උචිත ගමන්තාල යොදා ගනිමින් කරන ලද රංගනයෙන් ආංගික අභිනය ද අපූරුවට ප්‍රදර්ශනය විය. එබැවින් මතු දැක්වූ දේශීය සාම්ප්‍රදායික කලාංගවලට වඩා තරමක් ඉදිරියට ගිය ප්‍රාසංගික කලා ලක්ෂණ රාශියක් නාඩගම ඇසුරින් දක්නට හැකිය.

සිංහල, දමිළ, මුස්ලිම් ආදී වශයෙන් වූ ජනතාව අතර පොදුවේ පිළිගැනීමට ලක්ව තිබූ නාඩගම අභිබවා 1877 සිට නූර්ති නමින් හැඳින්වූ නව කලාංගය ජනප්‍රියවන්නට විය. එහි සංගීතය නාඩගම් සංගීතයට වඩා කන්කලු විය. මිහිරි විය. ඒ වූ කලී හින්දුස්ථානි රාගධාරී සංගීතය ඇසුරු කරමින් භාවිත වූවකි. නූර්ති නාටකවල ගීත නාඩගමේ මෙන් ඒකාකාරී නොවීය. විවිධ නාදමාලාවලට අනුව ස්වර රචනා වූ නූර්ති ගීත රාශියක් එකම නූර්තියක දී දැකීමට ඇසීමට